9965

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ............................................................ විභාග අංකය :- ..........................

## I කොටස

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.
- පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

---

(01) දහසක් වූ ජටිල පිරිස රහත් ඵලයට පත්වූයේ,
   (1) චන්දකින්නර ජාතක කථාව ඇසීමෙනි
   (2) ආදිත්ත පරියාය සූත්‍ර දේශනාව ඇසීමෙනි.
   (3) මහා ධර්මපාල ජාතක කථාව ඇසීමෙනි.
   (4) අනත්ත ලක්ඛන සූත්‍ර දේශනය ඇසීමෙනි.

(02) දහම් ගුණ පිළිබඳව කියවෙන "ඒහි පස්සික" යන්නෙහි අදහස නම්,
   (1) බුදුරජාණන් වහන්සේගේ ධර්මය මුල මැද අග මැනවින් දේශනාකර ඇත යන්නයි.
   (2) නිශ්චිත කාලයකට සීමා නොවී සෝවාන් ආදී මාර්ගවලට පත් මොහොතේදීම කල් නොයවාම ඵල අවබෝධය ලබාදෙන බවය යන්නයි.
   (3) විශ්වාසයෙන් පිළිගන්න යැයි නොකියා, එන්න, බලන්න, යනුවෙන් ආරාධනා කෙරෙන ස්වරූපය ඇති හෙයිනි යන්න ය.
   (4) තම සිතෙහි ඇති රාග. දෝස. මෝහ යන කෙලෙසුන් නැතිකර මේ ජීවිතයේදී ම සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වීමට හේතුවන නිසා යන්නයි.

(03). ප්‍රථම ධර්ම සංගායනාවේ දී විනය හා සම්බන්ධ කටයුතුවල ප්‍රධානත්වය හිමිවූයේ,
   (1) මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේට ය.
   (2) මහා කාශ්‍යප මහරහතන් වහන්සේට ය.
   (3) අනුරුද්ධ මහරහතන් වහන්සේට ය.
   (4) උපාලි මහරහතනන් වහන්සේට ය.

(04) කුසල ක්‍රියා වැඩි නම් සුළු පාප කර්මයක විපාකය අඩුවන බවත්, කුසල ක්‍රියා අඩු නම් සුළු පාප කර්මයක හෝ විපාකය වැඩිවන බවත් පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍රයක් වන්නේ,
   (1) ලෝණ ඵල සූත්‍රයයි.   (2) එලුපජීවී සූත්‍රයයි.
   (3) සිගාලෝවාද සූත්‍රයයි.   (4) වේළුද්වාර සූත්‍රයයි.

(05) පාසල් දරුවන් ලෙස අප්‍රමාදීව කටයුතු කිරීමෙන් ජීවිතය ජයගත හැකි බව අපි දනිමු. එසේ වීමට නම් අප විසින් කළයුතු ඉතාම වැදගත් ක්‍රියාවක් වන්නේ,

(1) ධාර්මික බවින් යුක්තව ක්‍රියා කිරීමයි. (2) අද කල යුතු දේ අදම කර අවසන් කිරීමයි.
(3) හික්මුණු ගතිය ඇතිකර ගැනීමයි. (4) සැකයට ලක්වන අයුරින් වැඩ නොකිරීමයි.

(06) ආහාර අනුභවයේ දී ඔබ විසින් අනුගමනය නොකළ යුතු ක්‍රියාවක් වන්නේ,

(1) ඉඳුල් පිරුණු අතින් ජල බඳුන් ඇල්ලීම
(2) තමාට අවශ්‍ය ප්‍රමාණයට ආහාර බෙදා ගැනීම
(3) ආහාර ගැනීමට කලින් අත කට සේදීම
(4) ව්‍යංජනවල ඇති ඉවත්කළ යුතු දේ බිම නොදමා භාජනයේ පසෙක තැබීම

(07) කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රිය වඩන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග රැසක් දේශනා කර ඇත. එම ගුණාංග ඇති පුද්ගලයාට තම අභිමතාර්ථ ඉටුකර ගත හැකි බව ද පෙන්වා දී ඇත. එම ගුණාංග සංඛ්‍යාවෙන්,

(1) 11 කි. (2) 10 කි. (3) 15 කි. (4) 18 කි.

(08) "මට ගැළපෙන දෙයක් මිස නොගැළපෙන දෙයක් මා කරන්නේ නැහැ. අනෙක දුවන විට බිම වැටී අතක් පයක් කැඩුන හොත් හැමදාම මව්පියන්ට බරක් වෙනවා නේද? යනුවෙන් පිළිතුරු ලබාදුන් සත් හැවිදිරි වියේ දී සෝවාන් තත්වයට පත් පෙර පින් කරන ලද තැනැත්තිය කවු ද?

(1) සුමනා දේවියයි. (2) කුමාර කාශ්‍යප මාතාවයි.
(3) සුජාතා දේවියයි. (4) විශාඛා සිටු දියණියයි.

(09) ඔබගේ මිතුරන්. මාපියන් හා ගුරු දෙගුරුන් අතර සත්‍යවාදී බව තුළින් විශ්වාසය දිනා ගැනීම සඳහා ඔබට කළ හැකි පහසු කාර්යයක් වන්නේ,

(1) පරපණ නැසීමෙන් හා සත්ත්ව හිංසාවෙන් වැළකීමයි.
(2) නොසුදුසු දේ ගැනීමෙන් වැළකීමයි.
(3) මත්වතුර භාවිතයෙන් වැළකීමයි.
(4) බොරු කීමෙන් වැළකීමයි.

(10) පාසල් ශිෂ්‍යයෙක් වශයෙන් ඔබේ පාසලේ ගුරු භවතුන්ට යුතුකම් ඉටු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,

(1) පොතේ පතේ දැනුම ලබාදීම
(2) පොතපත දැනුම මෙන්ම හොඳ දරුවෙක් ලෙස ජීවත් වීමට මඟ පෙන්වීම
(3) අපට ජීවත්වීමට උදව් කිරීම
(4) බාධකවලට නොබියව මුහුණදීමට කියා දීම

(11) කය හා වචනයෙන් සිදුවන වැරදි නොකිරීම, අන්‍යයන්ද එම වැරදිවලින් වළක්වා ගැනීම හා එම වැරදිවලින් වැළකීමේ ආනිසංස කියාදීම, සිල්වතුන් බවට පත්වීමට අවශ්‍ය මූලික පියවරකි. මේ සඳහා යෙදී ඇති වඩාත්ම නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) හිංසාව පීඩාව , ඝාතනය දූෂණය වංචාව ආදිය පිටුදැකීම ලෙස ය.
(2) කය වචනය යන දොරටුවලින් කෙරෙන අකුසලයන්ගෙන් වෙන්වීම ලෙස ය.
(3) කායික. වාචසික වැරදිවලින් වෙන්විය යුත්තේ පවට ඇති බිය නිසා යන්නයි.
(4) අත්තූපනායික ධර්ම පර්යාය ලෙස ය.

(12) ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසුව බුදු සසුන සුරක්ෂිත කිරීම සඳහා "භාණක පරම්පරා" ඇති විය. ඒ අනුව ආනන්ද තෙරුන් වහන්සේ ඇතුළු ශිෂ්‍ය පිරිසට හිමිවූයේ,

(1) දීඝ නිකායයි. (2) මජ්ඣිම නිකායයි.
(3) අංගුත්තර නිකායයි. (4) සංයුක්ත නිකායයි.

(13) බුදු සසුන සුරැකීමෙහි පළමු පියවර ලෙස ප්‍රථම ධර්ම සංගායනාව හැඳින්විය හැකි ය. එය පවත්තන ලද්දේ සම්බුද්ධ පරිනිර්වාණයෙන්,

(1) මාස තුනකට පසුව ය. (2) මාසයකට පසුව ය.
(3) වසර තුනකට පසුව ය. (4) මාස හයකට පසුව ය.

(14) සිතුවිල්ලෙන් මෙන්ම ක්‍රියාවෙන් ද එකිනෙකාට යහපත සිදුකරන බෞද්ධයෝ සිව්බඹ විහරණ ඇත්තෝ ය. එම සිව්බඹ විහරණවලට අයත් නොවන්නේ,

(1) දානයයි. (2) කරුණාවයි.
(3) මුදිතාවයි. (4) උපේක්ෂාවයි.

(15) බුද්ධ දේශනාවට අනුව "අතිථි බලි" යනුවෙන් හඳුන්වන්නේ,

(1) දෙමාපියන්ට සැළකීමයි. (2) භික්ෂූන් වහන්සේලාට සැළකීමයි.
(3) ආගන්තුකයන්ට සැළකීමයි. (4) ඥාතීන්ට සැළකීමයි.

(16) "යම් කෙනෙකු ස්ත්‍රීන් කෙරෙහි ලොල් වී, සුරා සූදුවෙහි ඇලී ගැලී කටයුතු කරන්නේ ද, ඔහු තමන් සතු සියලු සම්පත් විනාශ කරගනී" යන අදහස ඇතුළත් ගාථා පාඨය නම්,

(1) "කුසුමං වුල්ලිතං ඒතං" (2) "දානං සීලංච භාවනා
(3) "ඉත්ථී ධුත්තෝ සුරා ධුත්තෝ" (4) ඒක්කෙන භෝගේ භුංජෙය්‍ය"

(17) බුදු දහමේ ඉගැන්වීමට අනුව දස පුණ්‍යක්‍රියාවලදී පත්තිදාන යනුවෙන් දක්වා ඇත්තේ,

(1) පිරිසිදු සිතින් දන් දීමයි. (2) පින් අනුමෝදන් කිරීමයි.
(3) පිදිය යුත්තන් පිදීමයි. (4) ධර්ම දේශනා පැවැත්වීමයි.

(18) සසර සැප දෙන මහ පිංකම්දොළහක් පිළිබඳව කියැවෙන
"දන් සිල් භාවනා"
"පින් දෙනු අනුමෝදනා" යනාදී කවි ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(1) සුභාෂිතයයි. (2) කාව්‍යශේඛරයයි.
(3) ධම්මපදයයි. (4) ලෝවැඩ සඟරාවයි.

(19) මහින්දාගමනයෙන් පසුව බෞද්ධ සාහිත්‍ය මෙන්ම සිංහල භාෂා සාහිත්‍යය ද පෝෂණය විය. එසේ සිංහල භාෂා සාහිත්‍යය ද පෝෂණය වූ බවට දැක්විය හැකි කෘතියක් නම්,

(1) සද්ධර්ම රත්නාවලිය (2) බුත්සරණයි.
(3) පූජාවලියයි. (4) සිදත් සඟරාවයි.

(20) දියුණුවීමට කැමති පුද්ගලයා නිරන්තරයෙන්ම "යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව" කටයුතු කළ යුතු ය. මෙයින් කියවෙන්නේ,

(1) අප්‍රමාදීව කටයුතු කළයුතු බව ය. (2) සිල්වත්ව ජීවත්විය යුතු බවයි.
(3) මනස දියුණු කළයුතු බවයි. (4) හොඳින් විමසා බලා කටයුතු කලයුතු බවයි.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙකුත් ප්‍රශ්නවලට (ලකුණු (2+3+5 = 10) කි.

(01) ඔබ විසින් පන්තියේ දී සිදුකළ තෙවන වාරයට නියමිත ක්ෂණික කතා ඇගයීම් උපකරණය ඔස්සේ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) මහණෙනි, මෙම ධර්ම කරුණු මා විසින් විස්තර කරනු ඇත්තේ ද මේ අයුරින්ම යැයි බුදුරජාණන් වහන්සේගේ ඇගයීමට ලක්වූ මහ තෙරුන් වහන්සේ කවු ද? (ලකුණු 02)

(2) "යහපත් අරමුණක් වෙනුවෙන් තමා වෙත පැවරෙන කාර්යයන් නිවැරදිව ඉටුකිරීම සඳහා කැපවී කටයුතු කිරීම අපේ වගකීමයි. යන්න පැහැදිලි කරදීම සඳහා උදාහරණයක් ලෙස ගතහැකි ජාතක කථාව නම් කරන්න.

(3) බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩවෙසෙමින් සිවුවණක් පිරිසට දහම් දෙසූ වසර ගණන කොපමණ ද?

(4) බුදුරජාණන් වහන්සේට සිදුවිය හැකි විපත් කරදරවලින් මුදවා ගැනීම පිණිස ආනන්ද හාමුදුරුවන් ඉදිරිපත් වූ අවස්ථාවකට උදාහරණයක් සපයන්න.

(5) බුදු සසුනේ කාන්තා ප්‍රශ්න විසඳීම සඳහා වගකීම් භාරගෙන කටයුතු කළ උපාසිකාව කවු ද?

(6) වර්තමාන භික්ෂු සමාජය ශාසනික චිරස්ථිතිය වෙනුවෙන් කැපවී කටයුතු කරන්නේ බුද්ධ කාලයේ වැඩවිසූ කිනම් රහතන් වහන්සේලා අනුගමනය කරමින් ද?

(7) අග්‍ර උපස්ථායක ආනන්ද මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ඉමහත් ගෞරවයෙන් නොපිරිහෙළා ඉටු කළ කාර්යයන් දෙකක් ලියන්න.

(8) නිරතුරුවම චාරිකාවෙහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ වසරකට එක් වරක් එක් ස්ථානයක රැඳෙමින් ගත කළේ කුමන කාලයක දී ද?

(9) බුදුරජාණන් වහන්සේට පිරිනිවන් පෑමට ආරාධනා කළේ කවු ද?

(10) ශිෂ්‍ය නායකයෙකුට පැවරෙන වගකීම් කිහිපයක් ලියන්න.

(02) (1) සුද්ධෝදන රජතුමාගේ උසස් බව දක්වමින් බුදුරජාණන් වහන්සේ වදාළ ජාතක කථාවකුමක් ද? (ලකුණු 02)

(2) බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම නිසා සිදුවූ වැදගත් සිදුවීම් තුනක් ලියන්න. (ලකුණු 03)

(3) බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානයෙහි අගය ආදර්ශයෙන් පෙන්වූ අවස්ථාවක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

9365

(03) (1) බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දතාවයට කැමති නිශ්ශබ්දතාවයේ අගය වර්ණනා කරන බව පැවසූ සමකාලීන ශාස්තෘවරයෙකුගේ නමක් හා ඒ බව දැක්වෙන සූත්‍රයක නමක් ලියන්න. (ලකුණු 02)

(2) ඔබ සහෝදර සිසුන්ට ආමන්ත්‍රණය කිරීමේ දී යෙදිය හැකි ආශීර්වාදාත්මක යෙදුම් හා ස්වාමීන් වහන්සේලා සඳහා භාවිත කෙරෙන ශාසනික වචන තුන බැගින් ලියන්න. (ලකුණු 03)

(3) විහාරස්ථානයකට ඇතුළුවීමේ දී හා ඉන් පසුව බෞද්ධ දරුවෙකු ලෙස ඔබ අනුගමනය කරන සිරිත් විරිත් පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු 05)

(04) (1) චතුරාර්ය සත්‍ය ධර්මය ඇතුළත් බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනය සහිත සූත්‍රය කුමක් ද? (ලකුණු 02)

(2) ආර්ය සත්‍යය සතර පිළිබඳව පිරිවැටුම් තුන හෙවත් පියවර තුන නම් කරන්න. (ලකුණු 03)

(3) චතුරාර්ය සත්‍යය ධර්මය ඉගෙන ගැනීමෙන් පාසල් ශිෂ්‍යයෙකු ලෙස ලෞකික වශයෙන් ලද හැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) බුදුසසුනේ අග්‍ර දායිකාව වන විශාඛාවගේ දෙමාපියන් නම් කරන්න. (ලකුණු 02)

(2) විශාඛාව පතිකුලයට යන දින ඇයට තම පියාණන්ගෙන් ලැබුණු අවවාද තුනක් ලියන්න. (ලකුණු 03)

(3) විශාඛාවගේ චරිතයෙන් වර්තමාන සමාජයේ කාන්තාවන්ට ලබාගත හැකි ආදර්ශ පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු 05)

(06) (1) බුදුරජාණන් වහන්සේ කරණීයමෙත්ත සූත්‍රය දේශනා කරන ලද්දේ කවුරුන් උදෙසා ද? (ලකුණු 02)

(2) කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(3) බුදුදහමින් උගන්වන්නේ සතුරාගෙන් පළිගැනීම වෙනුවට සතුරාට ද මෛත්‍රිය කිරීමට යි. එසේ මෛත්‍රිය කිරීමෙන් අපට ලැබෙන ආනිසංස පහක් ලියන්න. (ලකුණු 10)

(07) (1) 'සදිසා නමස්කාරයේ දී ගුරුවරුන් හඳුන්වා ඇති දිශාව කුමක් ද? (ලකුණු 02)

(2) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් ලියා ඇති "ගුරු සිත නොරිදවා" යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(3) සදාචාර සම්පන්න සමාජයක් සඳහා ගුරු සිසු සම්බන්ධය වැදගත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)